# ජාතික රාජ්‍ය සභාවේ

# 1973 අංක 22 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 22 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 23/71.

මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 22 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන මෝටර් වාහන පනතෙහි 31 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 203 වන අධිකාරයේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) යම් වර්ෂයක යම්කිසි කාල සීමාවකදී වාහනය පාවිච්චි නොකිරීම පිළිබඳව 37 වන වගන්තිය යටතේ දැන්වීමක් කර තිබෙන, නැතහොත් එම වගන්තියේ (1) වන උප වගන්තියෙහි (ඇ) ඡේදයේ අතුරු විධානය යටතේ සහතිකයක් දී තිබෙන මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ආදායම් බලපත්‍රයක් සඳහා 30 (1) වන වගන්තියේ අතුරු විධානයෙහි (i) ඡේදය හෝ (ii) ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද කල්හි ඒ වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයත් බලපත්‍රය වලංගු විය යුතු දිනයත් අතර ඒ මෝටර් වාහනය නීති විරෝධී ලෙස පාවිච්චි කර නැතැයි බලපත්‍රය ප්‍රදානය කරන බලධරයා සෑහීමට පත් වුවහොත්; හෝ".

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 37 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) ඒ මෝටර් වාහනය සඳහා වූ ආදායම් බලපත්‍රය අවලංගු කිරීම සඳහා 40 වන වගන්තිය යටතේ ආපසු භාර දෙනු ලබන අවස්ථාවක, ඒ බලපත්‍රය ආපසු භාර දෙන දිනයේ සිට ආරම්භ වන, තම දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරන කාලසීමාව තුළ තමා ඒ මෝටර් වාහනය පාවිච්චි කිරීමට අදහස් නොකරන බව බලපත්‍රය ආපසු භාර දෙන දිනයෙහි හෝ ඊට පෙර ලියවිල්ලකින් දැනුම් දිය හැකි ය:

එසේ වුව ද මෝටර් වාහනය ලංකා ගමනාගමන මණ්ඩල යට අයිති අවස්ථාවක, එසේ ලියවිල්ලකින් කරන දැනුම්දීම හෝ බලපත්‍රය ආපසු භාර දීම හෝ වෙනුවට, සහතිකයෙහි නිශ්චිතව සඳහන් කරන කාලසීමාව තුළ මෝටර් වාහනය කිසිම මහා මාර්ගයක පාවිච්චි කරනු නො ලැබූ බව ප්‍රකාශ කරන්නා වූ මණ්ඩලය විසින් ඒ සඳහා බලය පවරන ලද නිලධරයකුගෙන් ලබාගත් සහතිකයක් බලපත්‍රය ප්‍රදානය කරන බලධරයා විසින් පිළිගත හැකි ය; නැතහොත්".

2—කේ 21822—9,535 (73/5)

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 190 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 190 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි (ඈ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඈ) සාමාන්‍යයෙන් කුලී මෝටර් රථවල හෝ යම් නියමිත පන්තියකට හෝ විස්තරයකට අයත් කුලී මෝටර් රථවල හෝ යම් නියමිත ප්‍රදේශවල පාවිච්චි කරනු ලබන කුලී මෝටර් රථවල, නියමිත අවශ්‍යතාවලට අනුකූල ව අනිවාර්ය යෙන්ම ගාස්තු මානක පාවිච්චි කළ යුතු බව නියම කිරීම ; ගාස්තු මානක පාවිච්චිය හා පරීක්ෂා කිරීම සහ අත්හදා බැලීම හා අලුත්වැඩියා කිරීම විධිමත් කිරීම සඳහා ද ගාස්තු මානක අලුත්වැඩියා කරන තැනැත්තන් හසුරුවීම, පරි පාලනය කිරීම, පරීක්ෂා කිරීම හා පාලනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම සහ ගාස්තු මානක පරීක්ෂා කිරීම, අත්හදා බැලීම හා අලුත්වැඩියා කිරීම සඳහා ගාස්තු නියම කිරීම ; ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 196අ යන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. (1) ප්‍රධාන ප්‍රඥප්තියෙහි 196 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියෙහි 196අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"ලංකා ගමනාගමන මණ්ඩලයේ වාහන වාර්ෂික ව පරීක්ෂා කිරීම හා සහතික කිරීම.

196අ. 196 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, 29 වන වගන්තියෙහි සඳහන් මෝටර් වාහනයක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරී මට පෙර එම වාහනය වාර්ෂික ව පරීක්ෂා කිරීම හා සහතික කිරීම, ලංකා ගමනාගමන මණ්ඩලයට අයිති මෝටර් වාහනයක් සම්බන්ධයෙන් වූ විට, මණ්ඩලය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ නිල ධරයකු විසින් කළ යුතු අතර එකී යම් වාහනයක් සම්බන්ධයෙන් ඒ නිලධරයා විසින් නිකුත් කරනු ලබන යම් යෝග්‍යතා සහතිකයක් 196 වන වගන් තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ලෙස මේ පනතෙහි කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.".

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත ආරම්භ වීමේ දිනයෙහි ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය.